M844

# නව වන ශ්‍රේණියේ පිරිමි සිසුන්ගේ විනය ගැටලුවල ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය (2010/2012)

ලියාපදිංචි අංකය 2010/Mphil/S/04

කේ.පී.චන්ද්‍රසේන
ශාස්ත්‍රවේදී ගෞරව (ආර්ථික විද්‍යාව-ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය)
අධ්‍යාපනපති (කොළඹ විශ්වවිද්‍යාලය)

University of Colombo Library Sri Lanka
UCLIB
567847

# සංක්ෂිප්තය

නව වන ශ්‍රේණියේ පිරිමි සිසුන්ගේ විනය ගැටලුවල ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක් නම් වූ මෙම පර්යේෂණ නිබන්ධය කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා කේ. පී චන්ද්‍රසේන විසින් ඉදිරිපත් කරනු ලැබේ.

අනෙක් රටවල්වල පමණක් නොව ශ්‍රී ලංකාවේ ද පාසල් සිසුන්ගේ විනය ගැටලු ඉහළ යමින් පවතී. නමුත් මේ සම්බන්ධයෙන් අපේ රටේ පර්යේෂකයින්ගෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබේ. එම නිසා තරමක් දුරට හෝ එම අවශ්‍යතාව සපුරාලමින් නව වන ශ්‍රේණියේ පිරිමි සිසුන්ගේ විනය ගැටලුවල ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා සහේතුක නියැදි ක්‍රමය වඩා යෝග්‍ය නිසා මෙම පර්යේෂණයේ දී සහේතුක නියැදි ක්‍රමය යොදා ගෙන තිබේ. ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ විනය ගැටලු වැඩි වශයෙන් පවතින පාසල් 20ක, නව වන ශ්‍රේණිවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදෙන ගුරුවරුන් 150දෙනෙකු, නව වන ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන සිසුන් 150දෙනෙකු, විනය මණ්ඩල සාමාජිකයින් 50දෙනෙකු හා විදුහල්පතිවරුන් 20දෙනා මෙම පර්යේෂණයේ නියැදියට අයත් වේ.

මෙම පර්යේෂණයෙන් සිසුන්ගේ විනය ගැටලු පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන නිසා සිසුන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා විනය මණ්ඩල සාමාජිකයින් වෙතට ළඟා විය හැකි වඩා සාර්ථක ක්‍රමය ලෙස විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයේ සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය යොදා ගෙන තිබේ. ගුණාත්මක දත්ත ලබා ගැනීමට හැකි වන පරිදි සැලසුම් කළ ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ, දත්ත ත්‍රිකෝණීකරණය කිරීමට හැකි වන ආකාරයෙන් පර්යේෂණ උපකරණ වශයෙන් යොදා ගන්නා ලදී.

එම පර්යේෂණ උපකරණ මගින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යොදා ගන්නා ලදී. ඒ අනුව විස්තරාත්මක වශයෙන් දත්ත විශ්ලේෂණය කර තිබේ.

අපේ රටේ පාසල් සිසුන්ගේ විනය ගැටලුවලින් වැඩි කොටසක් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ඒ පිළිබඳ නිසි අවධානයක් යොමු කිරීමෙන් අවම කර ගත හැකිය. තමා විසින් කරන ලද විනය විරෝධී ක්‍රියාවට ගැළපෙන දඬුවමක් දීම සම්බන්ධයෙන් සිසුන්ගේ අකමැත්තක් නොතිබේ. ඇතැම් නීතිරීති නිසා ගුරුවරුන් සිසුන්ගේ විනය

සම්බන්ධයෙන් දක්වන අවධානය අඩු වී තිබේ. විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යයින්, අධ්‍යාපනඥයින්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධරයන්, මනෝවිද්‍යාඥයින් හා සිසුන් යන සැම දෙනාගේ ම සහභාගිත්වයෙන් සිසුන්ගේ විනය පිළිබඳ නිතිරීති සකස් කොට පාසල්වල ක්‍රියාත්මක කළ යුතුය.

# ABSTRACT


This thesis – A study on the nature of disciplinary problems of grade nine male students by K.G Chandrasena is submitted for the Degree of Master of Philosophy in Education at the University of Colombo.

Not only in Sri Lanka but also in other countries disciplinary problems of students are increasing. But enough attention hasn't been paid to this problem by researchers in our country. So, this study focuses on the nature of disciplinary problems of grade nine male students.

In this research, a purposive sample providing adequate data in line with the objectives of the research has been used. 20 schools which are said to have more disciplinary problems of students in the district of Hambantota, 150 teachers who teach in grade nine classes, 150 students in grade nine classes, 20 principals and 50 disciplinary committee members of relevant schools have been selected as the sample.

Disciplinary problems of grade nine male students are studied in this research. To achieve the objectives of this research well, survey method of descriptive research method has been úsed as the methodology of the reseach because students, principals, teachers and disciplinary committee members can be reached very easily using this research method.

Questionnaires which were designed to obtain qualitative data, interviews, and obserservations were used as research tools so that triangulations could be done in order to maximize the validity of conclusions. Data collected using these research tools were analysed qualitatively.

Most of the disciplinary problems prevailing in our schools can be minimized by careful attention of teachers and principals. Students agree with the punishment not

exceeding the nature of misbehaviour or misdeed. The teachers do not pay enough attention to disciplinary problems of students because of some laws and regulations. The principals, teachers, parents, old pupils, educationists, high officials in the Education Department, psycologists and students should work together to make disciplinary laws and regulations and to enforce them in schools.